**මාලිම්බඩ ප්‍රාදේශීය සභාව**
**මාතර දිස්ත්‍රික්කය**
**-----------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 නොවැම්බර් 25 දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සභා බල ප්‍රදේශයේ ආදාහනාගාරයක් ඉදිකිරීම සඳහා 2001 වර්ෂයේදී ප්‍රධාන අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු රු.900,000 ක මුදල ලැබිය යුතු මුදලක් ලෙස සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) කොම්පෝස්ට් අංගනය ඉදිකිරීම සඳහා වූ ණයහිමි හා ණයගැති ශේෂවල එකතුව රු.101,602 කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

## 1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු ගිණුම් ශේෂ වල එකතුව රු.18,561,731 ක් වූ අතර, ඊට වර්ෂ 03 ක කාලයක් ඉක්මවූ රු.2,031,386 ක ශේෂ 18 ක් ඇතුළත්වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසානයට ගෙවිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු.9,461,265 ක් වූ අතර, ඊට වර්ෂ 03 ක කාලයක් ඉක්මවූ රු.2,346,448 ක ශේෂ 23 ක් ඇතුළත්වී තිබුණි.

## 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

එකතුව රු.30,024,362 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි 41 කට අදාළ හිමිකම් ඔප්පුද, එකතුව රු.2,650,027 ක් වූ තැන්පතු වර්ග 06 ක් පිළිබඳ විස්තරාත්මක උපලේඛනද, ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

## 1.3.4 නීති, රීති , රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත විස්තර දැක්වෙන නීති, රීති, රෙගුලාසි වල විධිවිධානවලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(1) (අ) වගන්තිය | වරිපනම් බදු ගෙවීම පැහැර හැර ඇති බදුකරුවන් පිළිබඳ ලැයිස්තු සහ දේපල තහනම් කිරීමේ වරෙන්තු ලැයිස්තු පිළියෙල කර නොතිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 193 | අයවැයගත හා පරිපූරක වැය සමග වියදම් විෂයයන්හි තථ්‍ය වියදම්, අතිරික්තතා හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 571 රෙගුලාසිය | වර්ෂ 05 ක කාලයක් ඉක්ම වූ රු.88,282 ක ගෙවිය යුතු ආරක්ෂිත හා මිශ්‍ර තැන්පතු ශේෂ පිළිබඳව කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.4,527,409 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.3,450,103 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,077,306 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

## 2.2 විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් වල රු.3,033,529 ක වැඩිවීමක් පෙන්නුම් කෙරෙන අතර, මුළු පුනරාවර්තන වියදම මුළු පුනරාවර්තන ආදායමින් සියයට 86 ක් විය. සභාවේ ආදායමට සාපේක්ෂව වියදම ඉතා ඉහළ මට්ටමක පැවතින.

(ආ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ දෙක තුළ සභාවේ මුළු පුනරාවර්තන ආදායම්, ආදායම් ආධාර සහ ස්වයං උත්පාදන ආදායම් මෙන්ම මුළු පුනරාවර්තන වියදම් පිළිබඳ සාරාංශගත විස්තරයක් පහත දැක්වේ.

| වර්ෂය | මුළු පුනරාවර්තන ආදායම් | ආදායම් ආධාර | ස්වයං උත්පාදිත ආදායම් | මුළු පුනරාවර්තන වියදම් | ස්වයං උත්පාදිත ආදායම් ඉක්ම වූ පුනරාවර්තන වියදම් |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| 2015 | 32,558,032 | 17,803,072 | 14,754,960 | 28,030,623 | (13,275,663) |
| 2014 | 28,447,197 | 14,545,240 | 13,901,957 | 24,997,094 | (11,095,137) |
| 2013 | 19,303,207 | 7,093,212 | 12,209,995 | 19,039,955 | (6,829,960) |

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ආදායම් ආධාර වල මෙන්ම ස්වයං උත්පාදන ආදායම් වල වර්ධනයක් විය.

(ඇ) සෑම වර්ෂයකම පුනරාවර්තන වියදම් අඛණ්ඩව වැඩිවන වේගයකින් වැඩි වී තිබුණු නමුත්, එම තත්ත්වය කෙරෙහි අවධානය යොමුකර වියදම් පාලනය කර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

(ඉ) සෑම වර්ෂයකම සභාවේ ස්වයං උත්පාදන ආදායම් ඉක්මවා සැලකිය යුතු ඉහළ අගයන්ගෙන් පුනරාවර්තන වියදම් පවතින බැවින්, ආදායම් ආධාර නොලැබෙන්නට ස්වයං උත්පාදන ආදායම් වලින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට කිසිදු ආකාරයකින් නොහැකි බව පෙන්නුම් කෙරේ.

(ඊ) ඉහත අංක (ඇ) සිට (ඉ) දක්වා ඡේද වල තත්ත්වය අනුව ආදායම් තත්ත්වය ඉහළ නංවා ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමුවිය යුතු බවත්, ඒ සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කළයුතු බවත්, එසේ නොමැති වුවහොත් සභාවේ මූල්‍ය තත්ත්වය සම්බන්ධයෙන් ගැටළු සහගත තත්ත්වයන් උද්ගත විය හැකි බවත්, එමගින් සභාවේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි අහිතකර බලපෑම් ඇති විය හැකි බවත් නිරීක්ෂණය විය.

## 2.3 ආදායම් පරිපාලනය

---------------------

### 2.3.1 වරිපනම් බදු

---------------

සමාලෝචිත වර්ෂයේ ආරම්භයට වූ හිඟ වරිපනම් බදු ශේෂයෙන් සියයට 38 ක් සහ බිල්කිරීම් වලින් සියයට 78 ක් අයකරගෙන තිබුණු නමුත්, හිඟ වරිපනම් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

### 2.3.2 අක්කර බදු

-------------

සමාලෝචිත වර්ෂය ආරම්භයට වූ හිඟයෙන් සියයට 12 ක් හා බිල්කිරීම් වලින් සියයට 44 ක් පමණක් අයකරගෙන තිබුණු නමුත්, හිඟ අක්කර බදු අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

### 2.3.3 කුලී

-----

සමාලෝචිත වර්ෂයේ ආරම්භක හිඟ ශේෂයෙන් සියයට 48 ක් පමණක් අයකර ගෙන තිබුණු අතර, හිඟ මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------

### 3.1 කාර්ය සාධන ඇගයීම

------------------------

සභා අරමුදල් යොදවා සංවර්ධන වැඩ යෝජනා 70 ක් ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දී තිබුණද, වර්ෂය තුළ ඉටුකර තිබුණේ වැඩ යෝජනා 04 ක් පමණි. සභාවේ ප්‍රධාන මුදල් පොත අනුව මාසික සාමාන්‍ය මුදල් ශේෂය රු.5,859,564 ක් වී තිබුණි. ඒ අනුව සභාවට ප්‍රමාණවත් මූල්‍ය ශක්තියක් තිබියදීත් යෝජිත කර්මාන්ත ඉටු නොකිරීම නිසා ප්‍රදේශයේ ජනතාවට ලැබිය යුතු සේවාවන් නිසි ලෙස ලැබී නොතිබුණි.

## 3.2 ආර්ථික නොවූ ගනුදෙනු

----------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් ඉටුකරන ලද කර්මාන්ත සඳහා සභාව සතුව බැකෝලෝඩරය යොදවා නොගෙන පෞද්ගලික ආයතනයකට අයත් බැකෝලෝඩරයක් යොදවා ගෙන රු.270,440 ක මුදලක් ගෙවා තිබුණි.

(ආ) ලයිට් ඩ්‍රම්ප් ට්‍රක් රථයේ පිරිවැයට වඩා රු.2,490,400 ක් වැඩි වටිනාකමක් මත රක්ෂණ ආවරණ ලබා ගැනීම නිසා රු.76,136 ක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පාලනය

------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභා බලප්‍රදේශයේ ආදාහනාගාරයක් ඉදිකිරීම සඳහා ලැබී තිබුණු රු.900,000 ක මුදලින් රු.800,000 ක් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබුණු අතර, ඉතිරි රු.100,000 ක මුදල පුනරාවර්තන වියදම් සඳහා යොදා ගැනීමෙන් සම්පූර්ණ මුදලම අරමුණින් බැහැර කටයුතු වෙනුවෙන් යොදවාගෙන තිබුණි.

(ආ) හොරගොඩ - මුස්ලිම්ගොඩ මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තය සති 55 ක් ප්‍රමාද වී නිමකර තිබුණු නමුත්, ප්‍රමාද කාලයට අදාළ රු.32,969 ක් දඩ මුදල අයකර ගෙන නොතිබුණි.

## 3.4 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

-----------------------------------

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රාදේශීය ලේකම් සතු ඉඩමකට සභාව විසින් කසල බැහැර කරමින් පැවැතුණු අතර, 2016 ජුනි මස වන විටත් එම ඉඩම සඳහා පරිසර බලපත්‍ර ලබාදී නොතිබුණි.

(ආ) වසරකට කසල කිලෝග්‍රෑම් 5250 ක් බැහැර කරන කර්මාන්ත ශාලාවකින් රු.1,250 ක මාසික කුලියක් අය කර තිබුණු අතර, බල ප්‍රදේශයේ වූ සත්ත්ව නිෂ්පාදන අලෙවිසැල් 17 ක කසල බැහැර කිරීමට ක්‍රමවත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියේ ප්‍රථම අදියරේ කටයුතු සති 9 ක ප්‍රමාදයක් සහිතව නිමකර තිබුණු නමුත්, රු.26,560 ක ප්‍රමාද ගාස්තු අයකරගෙන නොතිබුණි.

**4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

---

**4.1 අයවැය පාලනය**

---

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයන් 08 ක ඇස්තමේන්තුගත සීමාවන් ඉක්මවා රු.147,166,203 ක වියදම්ද, ආදායම් විෂයයන් 07 ක ළඟාකර නොගත් ඉලක්කගත ආදායම් රු.144,373,508 ක් සහ තවත් ආදායම් විෂයයක ඉලක්කගත ආදායම් ඉක්මවා රු.145,153 ක්ද වීම නිසා අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

**4.2 අභ්‍යන්තර විගණනය**

---

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි දැක්වෙන විධිවිධානයන් සහ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ දරන දකුණු පළාත් පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණු නමුත්, අභ්‍යන්තර විගණන නිලධාරියාට වැටුප් හා දීමනා ලෙස රු.460,224 ක මුදලක් ගෙවා තිබුණි.

**4.3 විගණන හා කළමනාකරණ කමිටුව**

---

2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුව පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

**4.4 වත්කම් කළමනාකරණය**

---

රාජ්‍ය පරිපාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් 2014 දෙසැම්බර් මස පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු රු.6,009,600 ක් වූ ලයිට් ඩම්ප් ට්‍රක්රථය 2015 වර්ෂයේදී ධාවනය කර තිබුණේ කිලෝමීටර් 368 ක් තරම් අවම ප්‍රමාණයකි.

**4.5 බේරුම් නොකළ බැරකම්**

---

සේවක අර්ථ සාධක අරමුදලට ගෙවිය යුතු රු.155,196 ක් වූ දායක මුදල් සහ ඊට අදාළ අධිභාර මුදල් ගෙවීමට හෝ බැරකම් ලෙස ගිණුම්ගත කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

**5.** **පද්ධති හා පාලනයන්**

-------------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන  ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) අයවැය පාලනය
(ආ) ගිණුම්කරණය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය